ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය
இலங்கைச் சனநாயக சோசலிசக் குடியரசு வர்த்தமானப் பத்திரிகை
The Gazette of the Democratic Socialist Republic of Sri Lanka

අති විශෙෂ அதிவிசேஷமானது EXTRAORDINARY

අංක 1064/42 – 1999 ජනවාරි 29 වැනි සිකුරාද – 1999.01.29
1064/42 ஆம் இலக்கம் - 1999 ஆம் ஆண்டு சனவரி மாதம் 29 ஆம் திகதி வெள்ளிக்கிழமை
No. 1064/42 – FRIDAY, JANUARY 29, 1999

(ආණ්ඩුවේ බලය පිට ප්‍රසිද්ධ කරන ලදී.) (அரசாங்கத்தின் அதிகாரத்துடன் பிரசுரிக்கப்பட்டது) (Published by Authority)

# I වැනි කොටස : (I) වැනි ඡේදය — සාමාන්‍ය

## ආණ්ඩුවේ නිවේදන

### 1995 අංක 35 දරන මිනුම් ඒකක, ප්‍රමිති හා සේවා පනත

1995 අංක 35 දරන මිනුම් ඒකක, ප්‍රමිති හා සේවා පනතේ 60(2) වන වගන්තිය යටතේ අභ්‍යන්තර හා අන්තර්ජාතික වාණිජ කටයුතු හා ආහාර අමාත්‍යවරයා විසින් කරන ලද නියෝග.

කිංස්ලි ටී. වික්‍රමරත්න,
අභ්‍යන්තර හා අන්තර්ජාතික වාණිජ කටයුතු හා ආහාර අමාත්‍ය.

1999 ජනවාරි මස 11 වන දින,
කොළඹ දී ය.

## නියෝග

01. මෙම නියෝග 1998 වර්ෂයේ මිනුම් ඒකක, ප්‍රමිති හා සේවා (අරමුදල්) නියෝග යනුවෙන් හැඳින්වේ.

02. (මින් මතු "පනත" යනුවෙන් හඳුන්වනු ලබන) මිනුම් ඒකක, ප්‍රමිති හා සේවා පනතේ කාර්යය සඳහා අරමුදල (මින් මතු "අධ්‍යක්ෂ" යනුවෙන් හඳුන්වනු ලබන) මිනුම් ඒකක, ප්‍රමිති හා සේවා අධ්‍යක්ෂ විසින් (මින් මතු "ලේකම්" යනුවෙන් හඳුන්වනු ලබන) අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම්වරයා විසින් විධානය කරනු ලබන ආකාරයට පවත්වාගෙන යා යුතු ය.

03. ජනවාරි මස 01 වැනි දින සිට ආරම්භ වන පරිදි, ඉදිරි වර්ෂය සඳහා ආදායම් හා වියදම් පිළිබඳ ඇස්තමේන්තුවක් අධ්‍යක්ෂ විසින් පිළියෙල කළ යුතුය. එසේ පිළියෙල කරන ලද ඇස්තමේන්තුව අදාළ මුදල් වර්ෂයට පෙර වර්ෂයේ අගෝස්තු මාසයේ අවසානයට කලින් ලේකම්වරයා වෙත ඉදිරිපත් කළ යුතුය. පවත්නා මුදල් වර්ෂය අවසන් වීමට පෙර එකී ඇස්තමේන්තුව සඳහා අමාත්‍යවරයාගේ අනුමැතිය ලබාගත යුතු ය.

1 A – H 1818 – 1,410 (99/01)

කිසියම් මුදල් වර්ෂයක් ඇතුළත, එම වර්ෂය සඳහා වෙන් කරන ලද මුදල් ප්‍රතිපාදනය වියදම් සඳහා ප්‍රමාණවත් නොවේ යැයි අධ්‍යක්ෂට හැඟීගියහොත්, එම මුදල් වර්ෂය අවසන් වීමට පෙර, හෙතෙම ප්‍රතිශෝධිත ඇස්තමේන්තුවක් ලේකම්වරයා වෙත ඉදිරිපත් කළ යුතු ය. එබඳු ප්‍රතිශෝධනයන් සඳහා අමාත්‍යවරයාගේ අනුමැතිය ලබාගත යුතුය.

04. සෑම මුදල් වර්ෂයක් ඇතුළත දී ම පනතට අනුව අරමුදලින් ඇති වූ වියදම් හා එයට ලැබුණු ආදායම් පිළිබඳ සියළු සත්‍ය විස්තර ඇතුළත් ගිණුම්, අධ්‍යක්ෂ විසින් ලේඛනගත කිරීම හෝ එසේ කිරීමට සලස්වා තිබිය යුතුය.

05. එක් එක් මුදල් වර්ෂයක් අවසාන වූ විගස ලේකම්වරයා විසින් විධානය කරනු ලබන පරිදි අධ්‍යක්ෂ විසින් අරමුදලේ පාලනය පිළිබඳව සකස් කරන ලද වාර්තාවක් ලේකම්වරයා වෙත ඉදිරිපත් කළ යුතුය.

06. පනතේ 35 වන වගන්තිය යටතේ අරමුදලින් ගෙවිය හැකි කිසියම් ත්‍යාගයක් පනතේ 57 වන වගන්තිය යටතේ ඉල්ලුම් කිරීමේ දී පහත සඳහන් නියෝගයන් අනුගමනය කළ යුතුය :-

(i) පනතේ 57 වන වගන්තිය යටතේ ත්‍යාගයක් ලැබීමට හිමිකම් ඇති පුද්ගලයා එය අධ්‍යක්ෂ වෙත ලිඛිතව ඉල්ලුම් කළ යුතුය ;

(ii) ඉල්ලුම්කරු විසින් තම අයදුම්පතෙහි පහත සඳහන් තොරතුරු ඇතුළත් කළ යුතුය :-

(අ) ඉල්ලුම්කරුගේ නම :-

(ආ) ඉල්ලුම්කරුගේ ලිපිනය ;

(ඇ) ඔහුගේ/ඇයගේ ජාතික හැඳුනුම්පත් අංකය ;

(ඈ) ඔහුගේ/ඇයගේ ඉල්ලීමට අදාළ නඩු අංකය, එම නඩු විභාගය පැවැත්වෙන උසාවිය, නඩුවට අදාළ කරුණු සහ/හෝ ඉල්ලුම් කිරීමට සම්බන්ධ රාජ්‍ය පත්‍රය ;

(ඉ) නඩුව පවරන ලද නීති වගන්තිය, නඩුවේ විනිශ්චය සහ (අදාළ වන පරිදි) නියම කළ දඩ මුදල සහ / හෝ රාජ්‍ය සන්තකයෙහි වටිනාකම ;

(ඊ) ඔහුට / ඇයට හිමි ඉල්ලුමෙහි ස්වභාවය සහ පදනම.

(iii) එසේ වුවත්, අවශ්‍යවේ යැයි අධ්‍යක්ෂවරයාට හැඟේ නම් තවදුරටත් තොරතුරු ලබා ගැනීමට ඔහුට පුළුවන. ;

(iv) ඉල්ලුම් කරන අයිතිවාසිකමෙහි නීත්‍යානුකූලභාවය පරීක්ෂා කර බලා, ත්‍යාගයෙහි ප්‍රමාණය නිර්දේශ කිරීම පිණිස අධ්‍යක්ෂවරයා විසින් තිදෙනකුගෙන් සමන්විත කමිටුවක් පත්කළ යුතු ය. එම කමිටුවට නියෝජ්‍ය අධ්‍යක්ෂ තනතුරට පහළ ශ්‍රේණියකට අයත් නොවන නිලධාරියෙකු කමිටුවේ සභාපති වශයෙන් ද සහකාර අධ්‍යක්ෂවරයකු හා අමාත්‍යාංශයේ ලේකම්වරයාගේ නියෝජිතයෙකු ද ඇතුළත් විය යුතු ය.

02 – 361

---

# பகுதி I: தொகுதி (I) – பொது

## அரசாங்க அறிவித்தல்கள்

### 1995 ஆம் ஆண்டின் 35 ஆம் இலக்க அளவீட்டு அலகுகள், நியமங்கள், சேவைச் சட்டம்

1995 ஆம் ஆண்டின் 35 ஆம் இலக்க அளவீட்டு அலகுகள், நியமங்கள், சேவைச் சட்டத்தின் 60 (2) ஆம் பிரிவின் கீழ் உள்நாட்டு, சர்வதேச வாணிப, உணவு அமைச்சரால் விதிக்கப்பட்ட ஒழுங்குவிதிகள்.

கிங்ஸ்லி ரி. விக்ரமரட்ன,
உள்நாட்டு, சர்வதேச வாணிப, உணவு அமைச்சர்.

கொழும்பு,
1999 சனவரி 11.

#### ஒழுங்குவிதிகள்

1. இவ்வொழுங்குவிதிகள் 1998 ஆம் ஆண்டின் அளவீட்டு அலகுகள், நியமங்கள், சேவை (கட்டு நிதி) ஒழுங்குவிதிகள் எனப் பொருள்படும்.

2. அளவீட்டு அலகுகள், நியமங்கள், சேவைகள் சட்டத்தின் நோக்கத்திற்கென (அதனகத்துப் பின்னர் "சட்டம்" எனக் குறிப்பீடு செய்யப்படும்) சட்டத்தின் 35 ஆம் பிரிவினால் நிறுவப்பட்ட நிதியை அமைச்சரின் அமைச்சுச் செயலாளரால் (இதனகத்துப் பின்னர் "செயலாளர்" எனக் குறிப்பீடு செய்யப்படும்) பணிக்கப்படுகின்றபடி அளவீட்டு அலகுகள், நியமங்கள், சேவைகள் பணிப்பாளரால் (இதனகத்துப் பின்னர் "பணிப்பாளர்" எனக் குறிப்பீடு செய்யப்படும்) நடாத்திச் செல்லல் வேண்டும்.